ගුරු භූමිකාවේ සාර්ථකත්වයට අධ්‍යාපන මනෝවිද්‍යාවෙන් ලැබෙන දායකත්වය

එන්.එම්.සී. සසිකලා කල්හාරි

අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

හැඳින්වීම

'ගුරු' යන්නෙන් බර හෝ ගැඹුරු බවත් 'වර' යන්නෙන් උතුම් බවත් අර්ථවත් වේ. ඒ අනුව ගුරුවරයා යනු දැනුම, උපදෙස්, කුසලතා මෙන් ම යහපත් ආකල්ප අතින් සමාජයේ සෙසු පිරිස්වලට වඩා ඉහළ මට්ටමක සිටින උතුම් පුද්ගලයෙකි. යුනෙස්කෝ ගුරු ප්‍රඥප්තියට අනුව ගුරුකම යනු හුදෙක් රැකියාවක් පමණක් ම නො වේ. එය වරෙක වෘත්තියකි. වරෙක සේවාවකි. නැතහොත් ඒ දෙකෙහි ම සුසංයෝගයෙන් සැදුම්ලත් සුවිශේෂී භූමිකාවකි. ශිෂ්‍යයා නිවැරදි ව හඳුනා ගැනීම සඳහා ගුරුවරයා සතු ගුරු පෞරුෂය සහ තම වගකීම පිළිබඳ මනෝවිද්‍යාත්මක අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය වේ.

දරුවන්ගේ නැණනුවණ පාදා ඔවුන් යහමඟට යොමු කිරීමට වෙර දරන ගුරුවරයෙකුට ළමා සංවර්ධන අවධීන් පිළිබඳ ව මනා වැටහීමක් තිබිය යුතු ය. එම අවධි වන්නේ ළදරු විය, ළමා විය හා නව යොවුන් වියයි. ජ්ලේටෝ, ජීන් පියාජේ, සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් සහ ඒබ්‍රහම් මැස්ලෝ වැනි ප්‍රකට මනෝවිද්‍යාඥයින් මෙම සංවර්ධන අවධිවල පවතින විවිධ ලක්ෂණ පිළිබඳ ව අදහස් දක්වා ඇත. එහි දී ජීන් පියාජේ පෙන්වා දෙන්නේ එක ම වයසේ පසුවන දරුවන් වුව ද ඔවුන් සංකල්ප ග්‍රහණය කරගනු ලබන්නේ එකිනෙකට වෙනස් ආකාරවලින් බවයි. (බ්‍රැන්ඩ්‍රියා, 1996) ළමා සංවර්ධනය යනු ළමයාගේ ශාරීරික, මානසික, චිත්තවේගික, සමාජයීය, සදාචාරාත්මක මෙන් ම පෞරුෂත්වයේ සිදුවන පූර්ණ වර්ධනයයි. එබැවින් දරුවෙකුගේ මනස මෙන් ම මෙම සමස්ත සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ ව ද ගුරුවරයා තුළ පවතින මනා අවබෝධය ඔහුගේ ඉගැන්වීම් කාර්යය වඩාත් සාර්ථක හා පහසු කරවීමට මහෝපකාරී වනු ඇත.

අධ්‍යාපන මනෝවිද්‍යාව සහ පන්ති කාමර කළමනාකරණය

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත වන ගුරුවරයෙකුට ළමා සංවර්ධන අවධීන් පිළිබඳ ව හැදෑරීමේ දී මනෝවිද්‍යාත්මක ප්‍රවේශ ප්‍රබල රුකුලක් වේ. සාර්ථක ගුරුවරයෙකු වීමට අධ්‍යාපන මනෝවිද්‍යාව විවිධාකාරයෙන් උපකාරී වන බව මහාචාර්ය දයා රෝහණ අතුකෝරාල විසින් පෙන්වා දී ඇත. ඒ 2000 වර්ෂයේ දී ය. එම අදහස් අනුව අධ්‍යාපන මනෝවිද්‍යාව ගුරුවරයාට ප්‍රයෝජනවත් වන ප්‍රධාන අවස්ථා 8කි.

- ශිෂ්‍යයන් පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම.
- තමා පිළිබඳ ව ස්වයං අවබෝධයක් ඇති කර ගැනීම.
- ශිෂ්‍යයන්ගේ චිත්තවේගීය අසහනයන් හා පීඩාවන් තේරුම් ගැනීම.
- ඉගැන්වීමේ විෂය කරුණු මෙන් ම ඊට උචිත ක්‍රමශිල්ප පිළිබඳ දැනුම ලබා ගැනීම.

- ශිෂ්‍ය ඇගයීම් හා ඇගයීම් කාර්යයන් විධිමත් ව සිදු කිරීම.
- උපදේශන හා මාර්ගෝපදේශන කාර්යයන් සාර්ථක ව ඉටු කිරීම.
- ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා ශිෂ්‍යයන් තුළ අභිප්‍රේරණය (පෙළඹවීම) ඇති කිරීම.
- ගුරුවරයා, සිසුන් හා සමාජය අතර අන්තර් පුද්ගල සබඳතා සාර්ථකව පවත්වා ගැනීම.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ කේන්ද්‍රීය සාධකය වනුයේ ශිෂ්‍යයා ය. ප්‍රකට අධ්‍යාපනඥයෙකු වන ජෝන්ස් ඇඩම්ස් පෙන්වා දෙන පරිදි සාර්ථක ඉගැන්වීමක් සඳහා ශිෂ්‍යයා පිළිබඳ අවබෝධය අත්‍යවශ්‍ය වේ. ඒ අනුව සෑම ගුරුවරයෙකු ම ප්‍රධාන කරුණු දෙකක් කෙරෙහි සම වගකීමකින් අවධානය යොමු කළ යුතු ය. එනම් තමා උගන්වන විෂය හා එම විෂයය ඉගෙන ගන්නා ළමයා ය. මින් වඩාත් ම වැදගත් වනුයේ ළමයා පිළිබඳ ව හැදෑරීමයි. සෑම ශිෂ්‍යයෙකු ම අනන්‍ය වූ දක්ෂතා හා ගතිලක්ෂණ සහිත සුවිශේෂී පුද්ගලයෙකි. සම වයසේ හෝ එක ම පන්තියේ සිටින දරුවන් බැලූ බැල්මට එක හා සමාන යැයි පෙනුන ද ඔවුන් තුළ විවිධාකාර වූ අසමාන චර්යා සහ පුද්ගල දක්ෂතා පවතී. ගුරුවරයා විසින් මෙම පොදු ලක්ෂණ මෙන් ම දරුවා සතු සුවිශේෂී අනන්‍යතාව ද නිවැරදි ව හඳුනාගත යුතු බව දයා රෝහණ අතුකෝරාල පෙන්වා දෙයි. පන්ති කාමරයක් තුළ දී ගුරුවරයාට නිරන්තරයෙන් ම විවිධ ප්‍රබලතා මෙන් ම දුබලතා සහිත දරුවන් මුණගැසේ. සාමාන්‍ය දරුවන්ට අමතර ව පහත දැක්වෙන විශේෂිත ගැටලුවලින් පෙළෙන සිසුන් ද පන්තියේ සිටිය හැකි ය.

- උදාසීන බව සහ අලස බවින් යුත් සිසුන්
- චර්යාමය සහ විනය ගැටලු ඇති සිසුන්
- ධාරණ ශක්තිය දුර්වල සිසුන් (මතක තබා ගැනීමේ අපහසුතා ඇති සිසුන්)
- ඉන්ද්‍රිය ආශ්‍රිත ආබාධ හෝ දුෂ්කරතා ඇති සිසුන්
- චිත්තවේගීය නොසන්සුන්තා ඇති සිසුන්

මෙවැනි දරුවන් දෙස ගුරුවරයා උපේක්ෂාවෙන්, ඉවසීමෙන් සහ දයාවෙන් බලා ඔවුන්ගේ ඉගෙනීමට ඇති හැකියාවන් මතු කර ගැනීම සිදු කළ යුතු ය. සිසුන් මුහුණ දෙන මෙකී ගැටලු නිවැරදි ව වටහාගෙන ඔවුන්ගේ බුද්ධි මට්ටමට සහ හැකියාවන්ට ගැළපෙන ප්‍රතිකර්ම හා ඉගැන්වීම් ක්‍රමවේද අනුගමනය කිරීමට අධ්‍යාපන මනෝවිද්‍යාව ගුරුවරයාට මග පෙන්වයි. එය සමස්ත ඉගැන්වීමේ කාර්යය සාර්ථක කර ගැනීමට ලැබෙන මහඟු පිටිවහලකි.

මෙම ක්‍රියාවලියේ දී ගුරුවරයා තමා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම ද වැදගත් ය. පන්ති කාමරය තුළ සිදුවන ගුරු-ශිෂ්‍ය අන්තර් ක්‍රියාවලියේ දී ගුරුවරයාට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. ගුරුවරයාගේ හැසිරීම, කතාබහ කරන විලාසය, ආකල්ප සහ ඔහු අන් අය සමඟ සබඳතා පවත්වන ආකාරය යන මේ සියල්ල සිසුන්ගේ දැඩි නිරීක්ෂණයට ලක්වන අතර ඔවුන් ඒවා අනුකරණය කිරීමට ද පෙළඹේ. විශේෂයෙන් ම ප්‍රාථමික ශ්‍රේණිවල පසුවන දරුවන් ගුරුවරයා යනු 'සියල්ල දත්', නිවැරදි දේ පමණක් ම කරන, ජීවිතයට ආදර්ශයට ගත යුතු හොඳ ම චරිත ආකෘතිය ලෙස සිතයි. (අතුකෝරාල, 2000)

එබැවින් ගුරුවරයා සෑම විට ම තමාගෙන් සමාජය අපේක්ෂා කරන උසස් සදාචාරාත්මක මට්ටමක හැසිරීමට වගබලා ගත යුතු ය. එසේ නොමැති වුවහොත් ඔහු විෂය දැනුමෙන් හෝ ඉගැන්වීම් ක්‍රමවේද අතින් කෙතරම් ප්‍රවීණයෙකු වුව ද සාර්ථක ගුරුවරයෙකු වීමට අපොහොසත් වනු ඇත. ගුරුවරයා ද මේ සමාජයේ ම සාමාජිකයෙකු බැවින් සාමාන්‍ය මිනිසෙකු ලෙස ඔහුට ද විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු වේ. වරෙක ඉච්ඡාභංගත්වයට පත්වීමට වුව ද හැකි ය. එහෙත් තමා සතු මනෝවිද්‍යාත්මක දැනුම නිසි ලෙස භාවිත කරමින් එම පෞද්ගලික ගැටලු පන්ති කාමරයට බලපෑමට ඉඩ නොදී පාසලටත් සමස්ත සමාජයටත් ආදර්ශමත් චරිතයක් වීමට ගුරුවරයා වගබලා ගත යුතු ය. ඒ සඳහා ගුරුවරයා පහත පරිදි කටයුතු කිරීම මනා ය.

- **ශිෂ්‍යයින්ගේ චිත්තවේග අසහනයන් තේරුම් ගැනීම**

ශිෂ්‍යයන්ගේ චිත්තවේගීය අසහනයන් තේරුම් ගැනීම ද ගුරුවරුකු සතු මහඟු කාර්යයකි. ඉගැන්වීම් කාර්යය සාර්ථක කර ගැනීම සඳහා සිසුන් මුහුණ දෙන මානසික, ශාරීරික, චිත්තවේගීය සහ සමාජයීය ගැටලු හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන් ම ළමා විය පසු කර නව යොවුන් වියට පා තබන විට දරුවන්ගේ ශරීරය තුළ සුවිශේෂී හෝමෝන සහ ජීව විද්‍යාත්මක වෙනස්කම් රැසක් සිදු වේ. මේ සමඟ ම ඔවුන්ගේ බුද්ධිමය, චිත්තවේගීය සහ සමාජීය හැසිරීම්වල ද ප්‍රබල පෙරළියක් ඇති වේ. මෙම අවධියේ පසුවන දරුවන් බොහෝ විට නායකත්වය ගැනීමට, ආදරය සහ සම්මානය (පිළිගැනීම) ලැබීමට දැඩි රුචිකත්වයක් දක්වයි. එමෙන් ම මිතුරු සබඳතාවලට මුල් තැන දෙයි. ඕනෑ ම කරුණක් දෙස තර්කානුකූල ව බැලීමට උත්සාහ කරයි.

‘නිරෝගී මනසක් පවතින්නේ නිරෝගී ශරීරයක් තුළ ය’ යන කියමනට අනුව ගුරුවරයා නිරන්තරයෙන් ම දරුවන්ගේ මානසික සෞඛ්‍යය කෙරෙහි සංවේදී විය යුතු ය. යොවුන් වියේ දී චිත්තවේග නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට හෝ ප්‍රකාශ කිරීමට නොහැකි වූ විට දරුවන් තුළ දැඩි මානසික අසහනයක් හට ගන්නා අතර එයින් අකීකරු හෝ ප්‍රචණ්ඩකාරී (අමානුෂික) චර්යාවන් ඉස්මතු විය හැකි ය. එවැනි වෙනස්කම් කල්තියා හඳුනාගෙන දරුවන්ට සහය වීමේ ශක්‍යතාව ගුරුවරයා සතු විය යුතු ය.

- **ඉගැන්වීමේ විෂය කරුණු හා ක්‍රමශිල්ප පිළිබඳ දැනුම ලබා ගැනීම**

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වයට බලපාන තවත් ප්‍රධාන සාධකයක් වන්නේ විෂය කරුණු සංවිධානයයි. (අතුකෝරාල. 2000) නූතන අධ්‍යාපන ක්‍රියාවලිය සැමවිටම ‘ශිෂ්‍ය කේන්ද්‍රීය’ විය යුතු අතර එහි දී ඉගැන්වීම් සිදු කළ යුත්තේ සිසුවා ‘දන්නා දෙයින් නොදන්නා දෙයට’ සහ ‘සරල දෙයින් සංකීර්ණ දෙයට’ ගමන් කරන ආකාරයට ය. දරුවාගේ වයසට සහ බුද්ධි මට්ටමට ගැළපෙන ඔවුන්ට දරාගත හැකි සහ පහසුවෙන් අවබෝධ කරගත හැකි පරිදි විෂය කරුණු තෝරා බේරා ගැනීමට අධ්‍යාපන මනෝවිද්‍යාව ගුරුවරයාට මඟ පෙන්වයි. එලෙස තෝරා ගන්නා විෂය කරුණු සිසුන් වෙත සන්නිවේදනය කිරීම සඳහා වඩාත් උචිත ඉගැන්වීම් ක්‍රමශිල්ප නිශ්චය කර ගැනීමට ද ගුරුවරයාට සිදු වේ. පන්ති කාමරයේ ස්වභාවය සහ අවස්ථාව අනුව සුදුසු ක්‍රමවේද භාවිත නොකළහොත් ඉගැන්වීම ඒකාකාරී වී ගුරුවරයා සිසුන්ට අප්‍රියජනක පුද්ගලයෙකු විය හැකි ය. එබැවින් අධ්‍යාපන මනෝවිද්‍යාත්මක සිද්ධාන්ත ප්‍රායෝගික ව ගුරු දිවියට සම්බන්ධ කර ගැනීමෙන් ඉගැන්වීමේ කලාව වඩාත් රසවත් මෙන් ම සාර්ථක එකක් කර ගැනීමට ගුරුවරයාට අවස්ථාව උදා වේ.

- **ඇගයීම් කාර්යය සාර්ථක කර ගැනීම**

ඉගැන්වීම (Teaching), ඉගෙනීම (Learning) සහ ඇගයීම (Assessment) යනු එකිනෙකට බද්ධ වූ වෙන් කළ නො හැකි ත්‍රිවිධ ක්‍රියාවලියකි. තමා සිදු කළ ඉගැන්වීම කෙතරම් දුරට සාර්ථක වී ද සහ සිසුන් එය කෙතරම් දුරට ග්‍රහණය කරගෙන තිබේ ද යන්න මැන බැලෙන්නේ ඇගයීම් ක්‍රියාවලිය මඟිනි. විවිධ අවස්ථාවල දී සිදු කරන ඇගයීම් හරහා ලැබෙන ප්‍රතිපෝෂණ (Feedback)) මෙන් ම ඉදිරි ප්‍රතිපෝෂණ ද ශිෂ්‍යයාගේ මෙන් ම ගුරුවරයාගේ ද ප්‍රගතියට අතිශයින් ම වැදගත් වේ. (අතුකෝරාල, 2000) ඒ අනුව පන්ති කාමරය තුළ දී කිනම් අවස්ථාවක කිනම් ආකාරයේ ඇගයීම් ක්‍රමවේදයන් (නිර්මාණාත්මක හෝ සාරාංශගත ඇගයීම්) භාවිත කළ යුතු ද යන්න නිවැරදි ව තීරණය කිරීමට අධ්‍යාපන මනෝවිද්‍යාව ගුරුවරයාට මහෝපකාරී වේ.

- **උපදේශන කාර්යය සාර්ථක කර ගැනීම**

වර්තමාන ගුරු භූමිකාව හුදෙක් පන්ති කාමරය තුළ ඉගැන්වීමට පමණක් සීමා නොවේ. අද වන විට ගුරුවරයා මඟ පෙන්වන්නෙකු, මනෝවිද්‍යාත්මක උපදේශකයෙකු, සාධාරණත්වය අගයන්නෙකු මෙන් ම යුක්තිය පසිඳලන්නෙකු වැනි විවිධ සමාජීය භූමිකාවන් රැසක් නිරූපණය කරන්නෙකු බවට පත් ව ඇත. පන්ති කාමරය තුළ දී සිසුන් විවිධ ගැටලුවලට මුහුණ දෙන අතර ඒවා ඇතැම් විට අධ්‍යාපනික ගැටලු හෝ පවුල් පරිසරයෙන් මතු වන සමාජීය ප්‍රශ්න විය හැකි ය. මෙවැනි සෑම අවස්ථාවක දී ම දරුවෝ බාහිර ලෝකයෙන් ආදරය, උණුසුම, සුරක්ෂිතතාව සහ කාරුණික මඟ පෙන්වීම් අපේක්ෂා කරති. සිසුන් මෙම අවශ්‍යතා බලාපොරොත්තු වන්නේ තම ගුරුවරයාගෙනි. දරුවන්ගේ මෙම මනෝවිද්‍යාත්මක අවශ්‍යතා නිවැරදි ව හඳුනාගෙන ඔවුන්ට අවශ්‍ය නිසි උපදේශනය හා මාර්ගෝපදේශනය (Guidance & Counseling) ලබා දීමට ගුරුවරයා සතු අධ්‍යාපන මනෝවිද්‍යාත්මක අවබෝධය අත්‍යවශ්‍ය වේ.

- **ඉගෙනීම සඳහා සිසුන් පෙළඹවීම**

නූතන අධ්‍යාපන ක්‍රියාවලිය තුළ වැඩි බරක් තබා ඇත්තේ 'ගුරුවරයාගේ ඉගැන්වීම' කෙරෙහි නොව 'ශිෂ්‍යයාගේ ඉගෙනීම' කෙරෙහි වන අතර එහි ප්‍රමුඛයා වන්නේ ද ශිෂ්‍යයා ය. එහි දී ගුරුවරයාගේ ප්‍රධානතම කාර්යය වන්නේ සිසුන් ඉගෙනීමට යොමු කිරීම, ඔවුන්ට මඟ පෙන්වීම සහ ඒ සඳහා ඔවුන් ව අභිප්‍රේරණය කිරීම ය. මෙම අභිප්‍රේරණය ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකි ය.

(1) බාහිර අභිප්‍රේරණය - තෑගි, ප්‍රශංසා හෝ ලකුණු වැනි බාහිර සාධක මඟින් ගුරුවරයා විසින් ශිෂ්‍යයා තුළ ඉගෙනීමට උනන්දුවක් ඇති කිරීම.

(2) අභ්‍යන්තර අභිප්‍රේරණය - බාහිර බලපෑමකින් තොර ව විෂය කෙරෙහි ඇති වන සහජ ඇල්ම කැමැත්ත නිසා ශිෂ්‍යයා තුළ මතු වන උනන්දුව.

සිසුන් තුළ මෙකී අභ්‍යන්තර සැඟවුණු ශක්‍යතාවන් හඳුනාගෙන ඔවුන් ව ඉගෙනුම් ක්‍රියාවලියට සාර්ථකව සම්බන්ධ කර ගැනීමට අධ්‍යාපන මනෝවිද්‍යාව ගුරුවරයාට මහෝපකාරී වේ.

- **අන්තර් පුද්ගල සබඳතා සාර්ථකව පවත්වා ගැනීම**

ගුරුවරයෙකු යනු සිය වෘත්තීය ජීවිතය තුළ නිරන්තරයෙන් ම විවිධ පාර්ශ්වයන් රැසක් සමඟ සමීප ව ගනුදෙනු කරන පුද්ගලයෙකි. එම ප්‍රධාන අන්තර් පුද්ගල සබඳතා අතර 'ගුරු - ශිෂ්‍ය සබඳතා', 'ගුරු - ගුරු සබඳතා', 'ගුරු - විදුහල්පති සබඳතා' හා 'ගුරු - දෙමාපිය සබඳතා' ප්‍රධාන වේ.

මෙම සෑම පාර්ශ්වයක් සමඟ ම මනා සුහදතාවක් සහ අන්‍යෝන්‍ය අවබෝධයක් පවත්වා ගැනීමට නම් මානව සබඳතා පිළිබඳ මනෝවිද්‍යාත්මක දැනුමක් ගුරුවරයා සතු විය යුතු ය. ගුරුවරයා සෑමවිට ම පාසලත් බාහිර සමාජයත් යා කරන සන්නිවේදන පාලමක් බඳු ය. විශේෂයෙන් ම දරුවන්ගේ හැදියාව, චර්යාත්මක වර්ධනය සහ අධ්‍යාපනික ප්‍රගතිය පිළිබඳ ව දෙමාපියන් සමඟ සාකච්ඡා කිරීමේ දී මනෝවිද්‍යාව ප්‍රායෝගික ව භාවිත කරන ගුරුවරයාට ඉතා සාර්ථක ප්‍රතිඵල අත්කර ගත හැකි ය.

සාරාංශයක් ලෙස අධ්‍යාපන මනෝවිද්‍යාව යනු ගුරුවරයා සතු වෘත්තීය මෙවලම් තියුණු කරන ප්‍රබලතම සාධකයකි. මනෝවිද්‍යාත්මක ඥානයෙන් සන්නද්ධ වූ ගුරුවරයා රළු ගලකින් අගනා පිළිමයක් නෙළන විශිෂ්ට මූර්ති ශිල්පියෙක් බඳු ය. ඔහු දරුවන්ගේ බුද්ධිමය, චිත්තවේගීය හා සමාජයීය සංවර්ධන අවධීන් නිවැරදිව හඳුනා ගනිමින් පන්ති කාමරයේ සිටින විවිධ දුබලතා සහිත දරුවන් පවා ඉවසීමෙන් සහ දයාවෙන් යුතු ව අනාගතයට ගැළපෙන පරිදි හැඩගස්වයි. මෙකී මනෝවිද්‍යාත්මක මූලධර්ම ප්‍රායෝගික ව ගුරු දිවියට බද්ධ කරගන්නා ගුරුවරයා 'හුදෙක් විෂය කරුණු පවසන්නෙකු නොවී' දරුවන්ගේ සැඟවුණු කුසලතා මතු කරමින් සුභාවිත සමාජයකට අවශ්‍ය පරිපූර්ණ මිනිසුන් නිර්මාණය කරන සැබෑ මනුෂ්‍යත්වයේ මූර්ති ශිල්පියෙකු වනු නොඅනුමානය.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අතුකෝරාල, ද. රෝහණ. (2000). *අධ්‍යාපන මනෝවිද්‍යාව හා ගුරුවරයා*. ශික්ෂා මන්දිර ප්‍රකාශන.

බ්‍රැන්ඩියා, ජ. (1996). *ගුරු සේවා වෘත්තිය පදනම*. සතරුවන් ප්‍රකාශකයෝ.